# විශ්ව දහම

සිරි සමන්තභද්‍ර අරහත් මහා ස්වාමීන්වහන්සේ

# විශ්ව දහම

**සිරි සමන්තභද්‍ර අරහත් මහා ස්වාමීන්වහන්සේ**

ප්‍රකාශනය

**සිරි සදහම් ආශ්‍රමය**

බෙල්ලන්තර, දෙහිවල

දුරකථනː 011 2 732700, 0773 686686

ෆැක්ස්ː 011 2 719550

E-mail: info@ashramaya.org

Web: www.ashramaya.org

මුද්‍රණය

**ෆාස්ට් ප්‍රින්ටරි (ප්‍රයිවට්) ලිමිටඩ්**

165, දේවානම්පියතිස්ස මාවත,

කොළඹ 10.

දුරකථනː 2682223, 5833323

ෆැක්ස්ː 2682224

E-mail: fastads@gmail.com

# සියලු බුදුවරුන්ගේ අනුශාසනාව

**සබ්බපාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා**
**සචිත්තපරියෝ දපනං - ඒතං බුද්ධාන සාසනං**
සියලු පව් නොකළ යුතුය - දස කුසල් රැස් කළ යුතුය
සිත දමනය වීමට සැලැස්විය යුතුය - සිත පිරිසිදු කරගත යුතුය
මෙය සියලු බුදුවරුන්ගේ අනුශාසනයයි

**ඛන්තීපරමං තපෝ තිතික්ඛා - නිබ්බානං පරමං වදන්ති බුද්ධා**
**න හී පබ්බජිතෝ පරූපඝාති - සමණෝ හොතී පරං විහෙඨයණ්තෝ**
ඉවසීම උතුම් වූ තපස් ගුණයකි - බුදුවරු නිවන එකම දෙය කොට කියති
අනුන් නසන්නා පැවිද්දෙක් නොවේ - අනුන් පෙළෙන්නා මහණෙක් නොවේ

**අනුපවාදෝ අනුපඝතෝ - පාතිමොක්ඛෙ ච සංවරෝ**
**මත්තඤ්ඤුතා ච භත්තස්මිං - පන්ථං ච සයනාසනං**
**අධිචිත්තේ ච ආයොගො - ඒතං බුද්ධාන සාසනං**
අනුන් හෙළා තළා කථා නොකළ යුතුය - අනුන්ට හිංසා නොකළ යුතුය
ප්‍රාතිමෝක්ෂ සංවරයේ පිහිටිය යුතුය - කායික හා මානසික විවේකයට පත්විය යුතුය
සමවත සඳහා සිත පුරුදු කළ යුතුය - ආහාරයේ පමණ දත යුතුය
මෙය සියලු බුදුවරුන්ගේ අනුශාසනාවයි

ගුරුවරුන්, දෙමවුපියන්, සහෝදරයන්, දරුවන්, මිත්‍රයන් යන
කිසිවෙක් මට නැත්තේය,

මා පෙන්වූ මාර්ගයේ යන්නෝ ද, මාගේ අරමුණු වෙනුවෙන්
බලාපොරොත්තු නොමැතිව

මා වෙනුවෙන් උදව් කරන්නන් ද, සැබෑවටම, මාගේ ගුරුවරුන්,
දෙමවුපියන්, දරුවන් හා

මිත්‍රයෝ වන්නේය.

**සිරි සමන්තභද්‍ර අරහත් මහා ස්වාමීන්වහන්සේ**

## ධර්ම පුස්තක මුද්‍රණයට දායක වීම

අති පූජනීය සිරි සමන්තභද්‍ර අරහත් මහා ස්වාමීන්වහන්සේ වැඩ සිටින සිරි සදහම් ආශ්‍රමය මගින් ප්‍රකාශයට පත් කරන ධර්ම පුස්තක මුද්‍රණය සඳහා ඔබට දායක විය හැකිය.

ඔබ මෙම පින්කමට දායක වීමට කැමැතිනම් පහත කූපනය පුරවා එවා හෝ  දුරකථනය මගින් හෝ විමසීම් කළ හැකිය.

විස්තරය

01. නම : ..............................................................................

02. ලිපිනය : ..........................................................................

03. දුරකථන අංකය : ...............................................................

04. දායක වන මුදල : .............................................................

05. දායක විමට බලාපොරොත්තු වන කාරණය :

.................................................................................................

.................................................................................................

වැඩි විස්තර සඳහා පහත දුරකථනයන්ට කථා කරන්න

දුරකථන : 011 2 732700, 0773 686686
ෆැක්ස් : 011 2 719550

ලේකම්
සිරි සදහම් ආශ්‍රමය
බෙල්ලන්තර, දෙහිවල.

අද්‍ය අපි සූදානම් සරල ආරම්භයක් ඔස්සේ ගැඹුරු අවසානයක් සොයා යාමට. ජීවිතය අලුතින් දකින්නට, අලුතින් කල්පනා කරන්නට, අලුතින් විමසා බැලීමට, සත්‍ය සොයා යන ගමන ආරම්භ කළේ කෙසේ ද ?, ඒ ගමනට ප්‍රවිෂ්ට වුණේ කෙසේ ද?, ඒ ගමන අවසන් කළේ කෙසේ ද?, ඒ අවසානය කෙබඳු ද?, ඒ ගමන අවසානයේ ලබන අසීමිත සැනසිල්ල, සුවය, නිර්වාණයේ සැපය කුමක් ද? මෙවැනි කරුණු කාරණා ඔස්සේ අපි ඒ ගැඹුරු අවසානය සොයා යන්නයි සූදානම් වෙන්නේ. ඊට කලින් සරල ආරම්භයක්.

ඕනෑම මනුස්සයෙක් මේ ලෝකේ උපත ලබන්නේ කුඩා ළදරුවෙක් ලෙස. උන් සියල්ලෝම ජීවත්

**වෙන්නේ සාමාන්‍ය සමාජයේ.** උන් සියල්ලෝම මවු කිරි බොනවා, ඉන් පස්සේ දෙමවුපියෝ ඇසුරේ ලෝකය අඳුනා ගන්නවා. ඇස,කන,නාසය,දිව,ශරීරය,මනස කියන ඉන්ද්‍රියයන් සය ගෝචර කරගන්න උදව් වෙන්නේ දෙමවුපියන්ගේ හා නෑදෑ හිතවතුන්ගේ අනුකම්පාව නිසා. ලෝකය අඳුනා ගන්නවා. මම තවත් වචනයක් පාවිච්චි කරනවා අනුසෝතගාමී මාර්ගය ඔස්සේ පියවරෙන් පියවර ගමන් කරනවා. ඒක ඔස්සේ පියමනිනවා, ජීවත් වෙනවා. නැත්නම් මම තවත් වචනයක් කියනවා සසර පුරුද්දට අසුවෙනවා.

**මේ මනුස්ස ලෝකේ ජීවත්වෙන හැමෝම සසරේ පුරුදුකරලා තියෙන්නේ යම් යම් දේවල් එකතු කරගෙන, ගොඩ ගහගෙන, තමන් වටා පරිසරයක් හදාගෙන ඒ පරිසරය ආරක්ෂා කරගෙන ජීවත්වෙන්න.** තමන්ගේ අනන්‍යතාව, නෑදෑයින්, හිතවතුන් මේ හැමෝම. ඉඩ කඩම් ගේ දොර මේ හැමදේම ආරක්ෂා කරනවා. ඒවා කරමින් දිගින් දිගට ජීවත් වෙනවා.

මාත් මේ දහම අවබෝධ කරන්න කලින් ඒ විධියට ජීවත් වුණා. ගිහියෙක් ලෙසත්, පැවිද්දෙක් ලෙසත්. ගිහි ජීවිතය අවුරුදු විසිහයක්ම ලෝකය පිළිබඳව ගවේෂණය කළා. ඉගෙන ගත යුතු යමක් ඇත්නම් ඒ සියල්ල සම්මත ලෝකයට සාපේක්ෂව ඉගෙන ගත්තා. යා යුතු යම් විශ්ව විද්‍යාලයක් වෙත්නම් ඒ සියල්ලටමත් ගියා. ලබා ගත යුතු යම් උපාධියක් වෙත්නම් ඒ සියල්ලත් ලබා ගත්තා. මේ සියල්ල

මේ විදියට සිද්ධ වෙනකොට අපි ඕනෑම කෙනෙක් කරන්නේ තමන්ගේ බලාපොරොත්තු හා අපේක්ෂා ඉෂ්ට කරගත්තාම එතන ඉඳල රස්සාවක් කරගෙන ගෙයක් දොරක් හදාගෙන හොඳට ජීවත් වෙන්න කල්පනා කරනවා. හැබැයි මගේ හිත ඊට වඩා වෙනස් වුණා. මේ සියල්ලෙන් ගැලවෙන්න, සියල්ලෙන් ගැලවිලා නිදහස් වෙන්න ඒ නිදහස ගැන මට ඉවක් වගේ දැනුණා. කුඩා කල ඉඳලම. හැබැයි ඒ සඳහා ගමන් කළ යුතු පාරක් මම දැනගෙන සිටියේ නෑ ඒ වනවිට. ඒ නිසා මම පැවිදි වුණා.

**හැබැයි පැවිදි සමාජය පිළිබඳවත් මට බොහොම අත්දැකීම් තිබුණා.** අවුරුදු විසිහයක ඉඳල පන්සල්වල, ආරණ්‍යවල බණ භාවනා කරලා ලබා ගත්ත බොහොම අත්දැකීම් තිබුණා. මම පැවිදි වෙනකොටම දැනගෙන හිටියා මා සොයන ඒ ගැලවීම, නිවීම, සැනසීම පැවිදි ජීවිතය තුළ නැතිබව. **ඒත් ලෝකේ දෙපැත්තයි තියෙන්නේ.** එක්කො ගිහි ජීවිතය තුළ ගැලවීම සොයාගන්න ඕන නැත්නම් පැවිදි ජීවිතය තුළ ගැලවීම සොයාග න්න ඕන. ගිහි ජීවිතය අවුරුදු විසිහයක්ම ගත කරලා මට ඒ ගැලවීම සොයාගන්න බැරිවුණා. ඊට පස්සේ මම තීරණය කළා මෙයට නොගිහින්, මෙය පරීක්ෂා නොකොට පූර්ව නිගමන දෙන එක වැරැදියි මම පැවිදි වෙලා මේ කියන දේ ඒක තුළ ගවේෂණය කරන්න ඕනෑ කියල.

විශ්වවිද්‍යාලයෙන් සමුගන්න මාසයකට පමණ පෙර මම සසුන්ගත වුණා. ඔහොම මහණ වෙලා කලක් ගියා ධර්මය හොඳට ඉගෙනගත්තා. ධර්ම දේශනා පවත්වන්න පටන්ගත්තා. රටපුරාම විශාල ප්‍රසිද්ධියක්, කීර්තියක් පැතිරුණා. හැමෝම කියන්න පටන්ගත්තා උන්වහන්සේ කියන දේශනා හරි ත්‍රිපිටකය ඇසුරු කරගෙන ධර්ම දේශණා කරනවා කියලා. විශාල දායකයෝ පිරිසක් එකතු වුණා. රාජ රාජ මහාමාත්‍යවරු විශාල ප්‍රමාණයක් උදව් කළා, එකතු වුණා. දේශනා පැවැත්වූවා, ප්‍රතිරූපයක් හැදුවා, ආරාම හැදුවා. මේ සියල්ල ගොඩ නගාගෙන සිටින විට මට නැවතත් අර සිත ඇතුළේ තිබ්ච්ච නොසොයා ගත්ත දේ පිළිබඳව මට නැවතත් අදහසක් ඇතිවුණා. මම මහණ වුණෙත් යමක් සොයන්න හිතාගෙනනේ.

මම නැවතත් කරලා තියෙන්නේ විශ්වවිද්‍යාලයේ ගිහින් රස්සාවක් කළා වගේ එකක්නේ. වපසරියක් හදාගෙන, හිතවතුන් දායකයන් පිරිසක් හදාගෙන ඥාති මිත්‍රාදීන් ටිකක් හදාගෙන උසස් යැයි සම්මත පුද්ගලයන් ටිකක් ඇසුරු කරගෙන, යාන වාහන ටිකක් පූජා කරලා තියෙනවා ඒවා පරිහරණය කරගෙන හැබැයි මට දැනෙනවා සිතේ සිතුවිලි වැඩ කරන බව. ඒ වැඩ කරන සිතට ඉවරයක් නැතිබව. ඒක දිගට ගලනබව, හැමතිස්සෙම සිත දවල්ටත්, රෑටත් අනාගතය තුළ හොල්මන් කරනබව. මට මේ දැනෙන විදියට ඔබලාටත් දැනෙනවා මේ මොහොතේදීත් අනාගතය තුළ රෑටත්, දවල්ටත් සිත හොල්මන්

කරනවා. ඒ කියන්නේ අනාගතයට සිත දුවනවා. දුවල අනාගතය සංවිධානය කරනවා මේ විදියටයි වෙන්න ඕනෑ කියල.

ඉන් පස්සේ ඊළඟ ක්ෂණයෙහි සිත අතීතයට යනවා අතීතයේ හොල්මන් කරනවා අතීතයේ වෙච්ච හොඳ දේවල් නරක දේවල් මේවා ගවේෂණය කරනවා. මෙහෙම දැනෙන විට මට තේරුණා ජීවිතය දුකයි කියල. දැන් මට මේ දුක දැනෙන්නේ ගිහියෙක් ලෙස නෙවෙයි පැවිද්දෙක් ලෙසයි. මම පැවිදි වුණේ දුක නැති කරන්න ඒ වුණාට මට දැනෙන්නේ දුක. එතකොට මම කල්පනා කරන්න පටන්ගත්ත මම හිතුව අපි හිතන මේ සාම්ප්‍රදායික මේ ක්‍රමය තුළත්, සාම්ප්‍රදායික ඇදහිලි විස්වාස තුළත්, සාම්ප්‍රදායිකව සිල් රැකගෙන හෝ සමාජය තුළ හෝ හුදකලාව ජීවත් වීමේ ක්‍රමය තුළ අපි සොයන මේ නිදහස, ගැලවීම නැතැයි කියල මට සැකෙන් වගේ දැනුණා.

එහෙම දැනෙන්න කලින් මම ඒ සියලු සීලයන් හොඳට ආරක්ෂා කළා. දෙපාරක්ම උපසම්පදා වුණා, ඒ සීලය හොඳට ආරක්ෂා කළා. ඒවා රැකගෙන කලක් යනකොට මට තේරුණා ඒවා කොච්චර රැකගෙන හිටියත් අවබෝධය නොලැබෙන බව.

දැන් මේ දේශනා පිටිදූවේ සිරිධම්ම හාමුදුරුවෝ කරන කොට බොහොම ශාන්තයි, නිවිලා, රූපවාහිනියෙන් බලනකොට අතක්වත් හොලවන්නේ නැහැ. හැබැයි මට තේරුණා මම ඒ කරන්නේ

**රගපෑමක් බව.** මිනිස්සු දකීවි කියල අතක්වත් නොසොල්වා සිටිනවා, හිනා නොවී සිටිනවා, කෙළින් කථා නොකර බයේ හැංගිලා සිටිනවා. එතකොට මගේ සිත මට කිව්වා **ඇයි ඔය මිනිස්සු දකීවි කියල කෙළින් වැඩ කරන්නේ නැත්තේ, ඇයි මවා පාන්නේ, ඇයි එක විදියකට ජීවත්වෙන්න බැරි?** කියල හැම තිස්සෙම වැඩ කරන්න පටන්ගත්තා. ඒවා වැඩ කරන විට මම තව තවත් සිත ගැනම සෙව්වා. මම මේ කාලේ වෙනකොට ධර්මය හොඳටම ඉගෙනගෙන ඉවරයි. මම හිතන්නේ වසර වශයෙන් කියනවා නම් මහණ වුණේ 2000 වසරේ ඔක්තෝබර් 12 වෙනිදා. ඊට පස්සේ 2005 වෙනකොට ලංකාවේ චිර ප්‍රසිද්ධියට පත්වුණා ධර්ම දේශනා තුළින්. හැබැයි 2008 වෙනකොට මට ජීවිතේ අලුත් දෙයක් තේරෙන්න පටන්ගත්තා.

**ඒ අතර තමයි නන්නාඳුනන ස්ත්‍රියක් ළමයෙක් අරගෙන ඇවිල්ල ඒ ළමයා මගේ කියල කිව්වා. මම එතකොට උපසම්පදා සීලය හොඳට ආරක්ෂා කරලා තිබුණා.**

සාමාන්‍ය දෙයක් තමයි ඕනෑම භික්ෂුවක් හොඳට සීලය ආරක්ෂා කරගෙන හිටියොත් ඔහු කැමැති නැහැ කාගෙන්වත් කතාන්දරයක් අහන්න. ඒක සාමාන්‍ය දෙයක්. දැන් එතකොට මට එහෙම කියනකොට හිතුව දැන් මොකක්ද මේකේ තේරුම මෙච්චර දුරට සීලය ආරක්ෂා කළාම මෙහෙම කියනවානම් දැන් මම මොකක්ද කරන්න ඕන. හැබැයි එතකොට

මට හැමෝම බැන්නා, දොස් කිව්වා, නින්දා කළා. සමහරු කිව්වා **ඇත්තටම තමුන්වහන්සේගේ තමයි ළමය** කියල. මම ඒත් නිහඬව සිටියා. අවසානයේ ඒ ස්ත්‍රිය උසාවියේ ගිහින් නඩුවක් දැම්මා. මම ඒත් නිහඬව සිටියා. නඩුව අහල ඉවරවෙනකොට උසාවිය තීන්දු කළා ඒ ස්ත්‍රිය කිව්වේ බොරුවක් කියල. මම ඒත් නිහඬව සිටියා. මම නිහඬව සිටියට මනුස්ස ජීවිතේ පිළිබඳව මම ගැඹුරට කල්පනා කළා. ඇයි මෙහෙම වෙන්නේ මිනිසුන්ට? ඇයි මේ වගේ බොරු චෝදනාවලට ලක්වෙන්නේ? ඒ බොරු චෝදනාවලට ලක්වුණාම ඒ චුදිතයා කියන දේ හැමෝම ප්‍රතික්ෂේප කරන්නේ ඇයි? එහෙමනම් මේ ලෝකේ කුමක් උඩ ද දුවන්නේ? මේ ලෝකේ දුවන්නේ බොරුවක් උඩ ද? මිනිස්සු හදාගත්ත මායාවක් ද මේක? මිනිස්සු දකින සිහිනයක් ද මේ ලෝකය? එහෙම නැත්නම් මේක යථාර්ථයක් ද?

මෙන්න මේ විදියට කල්පනා කරන්න පටන්ගත්තා. ඒ කල්පනා කරන අතර, මම ධර්මය පොත්පත් හොදට කියවල තියෙන කෙනෙක්. ඒ වගේම මට විශාල ගැඹුරු මතකයක් තියෙන කෙනෙක්. හොඳට සිහිය තියෙන කෙනෙක්. මගේ සිත පිරිසිදු වෙන බව මට දැනුණා. දැන් මම කාලයක් මාන්නයෙන් හිටියනේ මම සිල් රැක්කා, මම ප්‍රසිද්ධ කෙනෙක්, මම බොහෝ දෙයක් දන්නා කෙනෙක්, මට යමක් කළහැකි කෙනෙක්, **ඒ සියල්ල අර ස්ත්‍රිය ඇවිල්ලා අර ළමයා මගේ කියනකොට ඒ සියල්ල කැඩෙන්න පටන්ගත්තා.**

මට තේරුණා අපි ගොඩ නගාගත්ත ප්‍රතිරූපය තියෙන තාක්කල් පමණයි අපිට දුක ඇතිවෙන්නේ. පෞරුෂය තියෙනතාක්කල් පමණයි අසහනය ඇතිවෙන්නේ. කවුරුහරි කෙනෙක් ඇවිල්ලා ඒ පෞරුෂය කඩලා දැම්මොත් ඒ මිනිසා ඒක පිළිගෙන නිහඬ වුණොත් ඒ මිනිසාගේ සිත පිරිසිදු වෙන්න පටන්ගන්නවා. සිත නිවෙන්න පටන්ගන්නවා, සැනසිලි සුවයට වැටෙන්න පටන්ගන්නවා. දැන් මගේ සිත අපකීර්තියම සොයන්න පටන්ගත්තා. නින්දාවම සොයන්න පටන්ගත්තා. සාමාන්‍යයෙන් නින්දාව සොයන සිතක ස්වභාවය තමයි සිත හරිම ශක්තිමත්, හරි හයියයි. කිසි දෙකට කම්පා වෙන්නේ නැහැ. දැන් ඔතනින් නැවැතුණේ නැහැ. දැන් අර ස්ත්‍රිය ළමය අරගෙන ආවා ඉවරයි. නඩු තීන්දුව දුන්නා ඒ ස්ත්‍රිය කරන්නේ බොරුවක්, මායාවක් ඔය විදියට වුණා. **හැබැයි පස්සේ ඒ ස්ත්‍රිය අවුරුදු 2කට විතර පස්සේ ඇවිත් වැඳලා, මල් පූජා කරලා මේ කරපු බොරු චෝදනාවට සමාවෙන්න කියලා.**

ඒක වුණේ අවුරුදු 2කට පස්සෙනේ. ඉන් පස්සේ සියලුම පුවත්පත් විවිධ මඩ ප්‍රචාර පළකරන්න පටන්ගත්තා. දැන් පුවත්පත් ඔස්සේ, අන්තර්ජාලය ඔස්සේ මම කවදාවත් නොකරපු දේවල් කළා කිව්වා. මම ඒත් සද්ද නැතුව හිටියා. නොගිය තැන්වල ගියා කියල කිව්වා. මම ඒත් සද්ද නැතුව හිටියා. හැබැයි මට එතකොට තේරිලා තිබුණා සමාජයේ මිනිස්සු හේතුවක් නැතුව කාටහරි නින්දා කළොත්, බොරු

චෝදනා කළොත් එයාට යමක් ශාක්ෂාත් කරන්න පුළුවන් කියල.

මිනිස්සු හැමෝම කළේ තමන්ට ගෞරව කරන අයට ගෞරව කරගෙන ජීවත්වීම. මම, නින්දා කරන අයට ගෞරව කරන්න පටන්ගත්තා. මම, නින්දා කරන අයට ගෞරව කළේ ඔවුන්ට නින්දා කරන්න ඉඩ දුන්නා. මට ඒ වෙනකොට විශාල සමාජ බලයක් තිබුණා, දේශපාලන හිතවත්කම් තිබුණා. මම ඒ කිසිවක් පාවිච්චි නොකර සිටියා. ඒ පාවිච්චි නොකර බණින, දොස් කියන අයට බණින්න දුන්නා, නින්දා කරන්න දුන්නා. මම ඒ සියල්ල දෙස සිහිනුවණින් බලාගෙන සිටියා. මට තේරුණා මෙහෙම දිගට බලාගෙන සිටිනාවිට මේ සියල්ල දෙස, මැදහත් සිතින් ගවේෂණය කරමින් සිටිනා විට සිතාගන්න බැරි විදියට සිත පිරිසිදු වෙනබව. මම ඒකයි කියන්නේ අහිමිවීම සියල්ලෙහි උරුමයයි කියා. අහිමිවීම සියල්ල ඔබට ලබා දෙනවා කියා. හිමිවුණාම හරි බරයි රකින්න ඕනෑවෙනවා. අහිමි වුණාම ලේසියි නඩත්තු කරන්න කිසිවක් නැති නිසා. දැන් මේ අතර පුවත්පත් ඔස්සේ, රූපවාහිනිය ඔස්සේ, ගුවන්විදුලිය ඔස්සේ නොයෙකුත් අභූත චෝදනා එල්ල කළා. සමහරු කිව්වා සිවුරු හැරලා ගිහින්, තව සමහරු කිව්වා දැන් ළමයිත් ඉන්නවා කියල. තවත් සමහරු කිව්වා මම ළමයිත් එක්කත් ඉන්නවා දැක්කා කියලා. විවිධාකාර දොස් කිව්වා. නින්දා කළා, අපහාස කළා, ඒ වගේම නොයෙකුත් පින්තූර අන්තර්ජාලය ඔස්සේ ප්‍රචාරය

කළා. දැන් මම මේවා සේරම බැලුවා. ඒ විතරක් නෙවෙයි ඒවාට බණින ඒවත් මම කියෙව්වා. කියවල මම නිහඬ වුනා.

**මට ඕනෑ වුණා මෙතෙක් කලක් තිස්සේ අපි කළේ බණින අයට බැනල ප්‍රශ්නය සමනය කරපු එක. ඒකනේ ක්‍රමය වෙලා තිබුණේ. ඒකෙන් ලැබුණ දෙයක් තිබුණේ නැහැ.** ඒකෙන් නැවත ප්‍රතිරූපය හදාගෙන නැවත පරණ විදියට ජීවත්වුණා. මට ඕනෑ වුණා එකේ අනික් පැත්ත බලන්න. බණින අයට බණින්නේ නැතුව බණින්න දුන්නාම මට වෙන්නේ අන්තිමට මොකක්ද කියල බලන්න. කවුරුහරි කෙනෙක් තමන්ට නින්දා අපහාස කරගෙන දිගට යනකොට එයාට නින්දා අපහාස කරන්න ඉඩ දීලා හිත සන්සුන් කරගෙන ඒ දෙස බලාගෙන සිටියොත් ඒ උතුමාගේ මමත්වය නැතිවෙලා සිත පිරිසිදු වෙලා නිවන් අවබෝධ වෙනවා. ඕක තමයි රහස. හැබැයි තියෙන ප්‍රශ්නය ඔය රහස ශාක්ෂාත් කරන්න තියෙන රහස ප්‍රතිවිරුද්ධ මාර්ගයක්. මෙතෙක් කල් අපි ලෝකේ දැකල තිබුණේ මිනිස්සු රස්සාව කරලා, ගේ දොර හදාගෙන, යාළු මිත්‍ර හිතවත්කම් හදාගෙන ජීවත් වීමක්. හැබැයි එහි ප්‍රතිවිරුද්ධ පැත්තට ගිය කෙනෙක් දැක්කේ නැහැ. දැන් මේ ප්‍රතිවිරුද්ධ පැත්ත ගැන මට ඉවක් වගේ දැනුණා. මම ඊට පස්සේ ඒකම සොයාගෙන ගියා. බණින මිනිසුන්ට බණින්නම ඉඩ දුන්නා. ඒ කිසිම පුවත්පතකට වචනයක්වත් කතානොකර නිහඬව සිටියා.

ඔය විදියට ඉන්නකොට 2011 වසරේ පිටිදූවේ සිරිධම්ම හාමුදුරුවෝ වෙනස් වුණා. උන්වහන්සේ අවබෝධයට පත්වුණා. අවබෝධයට පත්වෙච්ච ගමන් කරපු පළවෙනි කාර්ය තමයි මාස කිහිපයක දී මට තේරුණා මගේ සිත දැන් වෙනස් වෙච්ච බව. ඒ වෙනස් බව තේරිච්ච වෙලාව හරි අමුතු අත්දැකීමක් ඒක. හැබැයි ඒක කාලයක් ගිහිල්ල තමයි මට මතක් වුණේ. සියල්ල කියන්න මෙතන වෙලාවක් නැහැ. ඔහොම වෙනස් කළාම 2011 වසරේ ඒ අවට පන්සල්වල 200 ක් විතර පිරිසක් භික්ෂූන් වහන්සේලා සහ ගිහි අය ඇවිත් විශාල මැර ප්‍රහාරයක් දියත් කළා. ඊට පස්සේ මම එතනට ආවා. ඔවුන් මට නොසෑහෙන්න හිංසා කළා. දොස් කිව්වා, අපහාස කළා. මම ඒ සියල්ල කිසිම ගානක් නැතුව අහගෙන සිටිය. සියලු බලය තියෙද්දී, සියලු හැකියාවන් තියෙද්දී ඒ කිසිවක් නැති කෙනෙක් ලෙස ඔවුන් දෙස බලාගෙන සිටියා. හැබැයි එතකොට තේරුණා මගේ සිත මහා අමුතුම තත්වයකට පත්වෙලා තියෙන්නේ කියල. මේ අය මොනතරම් දේවල් කළත් මට කිසිම ගානක් නැහැ. කිසිම දෙයක් ගැන කම්පනයක් තේරෙන්නේ නැහැ, කිසිම දෙයක් ගැන චලනයක් තේරෙන්නේ නැහැ. ඔවුන් නොයෙකුත් හිරිහැර කළා. කරලා මාධ්‍යවලට බොරු කියල පුවත්පත්වල, රූපවාහිනිවල විශාල බොරු ප්‍රචාර හැදුවා. ඒවා ඔක්කොම බොරු කථා. ඒවා හැදුවා විතරක් නෙවෙයි ඒවා මිනිස්සු අතරට යවන්න ක්‍රමත් හැදුවා.

සාමාන්‍යයෙන් මේ ලංකාවේ ස්වභාවය තමයි කල්පනා කරලා, විමසලා බලන කෙනෙක් නෑ. දැන් **අපි හෙට පත්තරේක දැම්මොත් හරකෙක් ඇවිල්ල අං 28ක් තියෙනවා කියල, මිනිස්සු පෝලිමට එනවා ඒ හරකා බලන්න.** ඒ වගේ තමයි ලංකාවේ බොහොමයක් මිනිස්සු.

දැන් තමයි ටිකක් ඥානවන්ත වෙලා තියෙන්නේ අන්තර්ජාලය පැමිණීම නිසා. **අපි අහල තියෙනවනේ ගෝණි එළුවාගේ කථාව.** මිනිස්සු හැමදාම කරන්නේ එක එක අය නිසා ගොනාට අඳින එක. එහෙම වෙන්නේ නැතුව ඤාණවන්තව සමාජයේ වැඩකටයුතු කරන්න ඕනෑ. ඒ ඤාණ මාර්ගයයි මා සමාජයට උගන්වන්නේ.

දැන් 2011 වෙනකොට මගේ සිත හොඳට ශක්තිමත්. මට විශාල ධර්මයක් වැටහෙන බව මට තේරුණා. මම ඒවා කිව්වා. ඒ විතරක් නෙවෙයි පොත්පත්වල ලිව්වා. අද වෙනකම්ම ඒ පොත්පත් පවතිනවා. මේ විදියට ගියා.

කාලයක් තිස්සේ මම කාටවත් නොකියා පරීක්ෂා කරපු කාලයකුත් තිබුණා. දැන් මට මේ ඇත්තම එක බලන්න අවශ්‍ය වුණා. **මේ ඇත්තම ද? නැත්නම් සිතතුළ මුළාවට පත්වුණාම ඇතිවෙන විකෘතිතාවයක් ද?** කියල. **මම ඒකට ක්‍රමයක් යොදා ගත්තා.** එකක් තමයි මට තේරිච්ච ධර්මය සමාජයේ සිටින සියලුම තරාතිරම්වල මිනිසුන් සමග මම සාකච්ඡා කළා. හුඟ

ක් උගත් අය, ධනවත් අය, ඒවගේම කිසිම උගත්කමක් නැති සාමාන්‍ය මිනිස්සු සමග සාකච්චා කළා. ඒ විතරක් නෙවෙයි. මට තේරිච්ච සියලු ධර්මය බුද්ධ වචනය ඇසුරෙන් පරීක්ෂා කළා. මේකේ තියෙනව ද මේ තේරෙන ඒවා. ඔව්, සියල්ල තියෙනවා. **භගවත් ගීතාව, කුරානය, බයිබලය සියල්ලේම මේ මට තේරෙන දේවල් මගේ හදවතට දැනෙන ඒ දහම ඒ පොත්පත්වලත් බැලුවා.** එවාගේත් තියෙනවා. දැන් මට පැහැදිලි වුණා මට මේ අවබෝධ වෙන්නේ මම සොයමින් ගිය නිවන බව, නිදහස බව, සැනසිලි සුවය බව. ඒ වෙනකොටත් අපිට විශාල දායක පිරිසක් හිටියා. මේ මොන චෝදනා කළත් ඒගොල්ලෝ මේ කිසිදෙයක් පිළිගත්තේ නැහැ. මොකද අපි ඒගොල්ලෝ බොහොම ළඟින් ඇසුරු කරන අය. එයාල දන්නවා තමන්ගේ පන්සලේ හාමුදුරුවෝ වැරැදි වැඩ කරනවානම් දායකයන්ට හංගන්න බැහැනේ. එතකොට එයාලා මේ සියල්ල දැනගෙන සිටියා.

ඒ නිසා ඒ හැමෝම ඒ සියලුම උපස්ථාන ඒ විදියටම කළා. ඒ නිසා මට කිසිම ප්‍රශ්නයක් වුණේ නැහැ ඒ වැඩපිළිවෙළ, ආරාම හදපුව ඒ සියල්ල ලස්සනට සිද්ධවුණා. දැන් ඔය විදියට යනකොට පුවත්පත්වලින් නොයෙක් විදියේ මඩ ප්‍රචාර එල්ල වුණා. මම මුල දී ඒවාට උත්තර දුන්නේ නැහැ. පස්සේ ඒවාට මම ටික ටික උත්තර දෙන්න පටන්ගත්තා. මිනිස්සු නොයෙකුත් චෝදනා කළා. දැන් දකින්න ඇති සමහරු කිව්වා. ටී ෂර්ට් එකක් ඇන්දා කියල කහ

පාට. කහ පාට ටී ෂර්ට් මම විතරක් නෙවෙයි ලංකාවේ ඉන්න ඔක්කොම හාමුදුරුවරු අඳිනවා. නුවරඑළියේ යනකොට, පිටරට යනකොට, ශ්‍රී පාදයේ යනකොට. ඒක සාමාන්‍ය දෙයක් එකේ කිසිම රහසක් නැහැ. අනික කොළ පාටින් ඇන්දනම් තමයි වැරැදි. ගිහි ඇඳුමක් වෙන්නේ පාට වෙනස් වුණොත් විතරයි. ඒක සාමාන්‍ය දෙයක්. ඒකට හේතුව තමයි වරදක් සොයාග න්න නැති නිසා ඕවා සෙව්වා. හොයමින් බණිමින් කලක් සිටියා. ලෝකේ සත්‍ය සොයා ගත්තනම් කෙනෙක් ඒ සත්‍ය සොයාගත්ත මිනිසා අඳුනගන්නේ මුළු සමාජයම එකතුවෙලා ඒකපාර්ශික වෙලා ඒ උතුමට මුල දී බණිනවා.

ඒක හරියට උපමාවකින් කියනවා නම් ත්‍රස්තවාදියෙක් වගේ. සත්‍ය සොයාගත් කෙනා. හැමෝම නින්දා කරනවා. හැබැයි ඒ සියලු දෙනා කරන ඒ අභූත චෝදනා අයෝමය පර්වතයක් සේ නොසෙල්වී, චලනය නොවී සියල්ල කෙරෙහි නොබැඳී නිදහසේ සිටිනවා. මොකද ඔහු සත්‍ය අවබෝධ කරගත් නිසා. ඔය විදියට ගියා 2012 වසර ගතවුණා. ඒ අතර දේශනා කරන්න පටන්ගත්තා. විශාල පිරිසක් ඇවිත් සසුන්ගත වුණා.

ඒ දහම අහන විශාල පිරිසක් ලෝකේ පුරාම බිහිවෙන්න පටන්ගත්තා. ඒත් අර පුවත්පත්වලින් කරන මඩ ප්‍රචාර නැවැත්තුවේ නැහැ. තව තවත් මඩ ගැහුවා. ඒත් මම මඩ ගහන්න දුන්න මොකද ඒක

අවශ්‍යයි හේතුව එතකොට තමයි ඒ දහම මිනිස්සු අතරට ගමන්කරන්නේ. උත්තර දීමත්, මඩ ගැසීමත් මේ දෙකම සිදු වුණාම හරිම ලස්සනට ඒ දහම යනවා.

මෑත කාලෙම කරපු දේ තමයි අපි ජන්ම දිනේට විශාල දානයක් දුන්නා. පත්තරවල ඔක්කොගෙම කිව්වා පාටියක් දුන්න කියල. පාටි දාන පන්සලුත් තියෙනවා ඒවා ඒ පත්තරකාරයෝ ඔක්කොම දන්නවා. ඒවා ගැන නොලියා පාටි ප්‍රතික්ෂේප කරන, උපන් දිනේට පාටි දාන්න එපා පින්කම් කරන්න, උපන්දිනය කියන්නේ ඉපදිච්ච දවස නෙවෙයි මැරෙන්න ළංවෙච්ච දවස, එදාට තමන් සන්තකයේ යමක් තියෙයි නම් අනික් අයට දෙන්න. පින්කමක් කරනකොට ලස්සනට කරන්න එහෙම කරන කෙනාට නොයෙකුත් අභූත චෝදනා එල්ල කරමින් මම දැක්ක පත්තරවල දාල තියෙනවා. එතකොටත් අපි නිහඬ වුණා. හැබැයි අපි ඒවාට පිළිතුරුත් ලිව්වා. ඒ වගේම දානයක් දෙනකොට මස් මාළු දුන්නා කියල විශාල කලබලයක් කළා ජෛනයෝ ටික එකතු වෙලා. බුද්ධාගමේ අයට නම් ප්‍රශ්නයක් නැහැ මොකද බුද්ධාගමේ නැනේ මස් මාළු වළඳන්න එපා කියල. ඒවා ඕනෑ කෙනෙකුට වළඳන්න පුළුවන්. සත්තු මරන්න එපා කියල තියෙන්නේ. ජෛන ආගමේ තමයි තියෙන්නේ මස් මාළු කෑම තහනම් කියලා.

මම ඒකෙන් දැනගත්ත ජෛන මහාවීර මැරුණට ශ්‍රාවකයෝ ටික ඉන්නේ ශ්‍රී ලංකාද්වීපයේ කියල. සමහරු තාමත් බණිනවා. ඒ බනින ඔක්කොම ජෛන

ශ්‍රාවකයෝ, නිඝණ්ඨයෝ. ඒක දැනගන්න පුළුවන් කෙනෙක් දේවදත්තගේ වර පහට ළංවෙනවා නම් ඔහු නිඝණ්ඨයෙක්. පස්වෙනි වරය තමයි භික්ෂුව ජීවිතාන්තය තෙක් මස් මාළු කෑමෙන් වැළකිය යුතුය. ගෞතම බුදුන්වහන්සේ ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කළා. "අනුඥාතං ත්‍රිකෝටික පාරිශුද්ධං මච්ච මංසං අධිට්ඨං අසුතං අපරිසංඛිතං"තථාගතයන් අනුදැන වදාළා වූ ත්‍රිකෝටික පාරිශුද්ධය අවශ්‍යනම් භික්ෂුවකට වළඳන්න පුළුවන්.

ඒ වගේම සූත්‍ර පිටකයේ මජ්ඣිම නිකායේ ජීවක සූත්‍රයේ මෙහෙම සඳහන් වෙනවා, ජීවක වෛද්‍යතුමා බුදුන් වහන්සේ හමු වී මෙහෙම අහලා තියෙනවා. "ස්වාමීනි රජගහ නුවර වැසියෝ මෙලෙස පවසනවා, ඔබ වහන්සේ වෙනුවෙන් සතුන් මරති, එය දැන දැනත් ඔබ වහන්සේ ඒ මස් වළඳති." කියලා. මෙහි දී ජීවක වෛද්‍ය තුමාට පැවසුවේ, "මම වනාහි තුන් කෙළවරින් යුත් මාංසය නොවළඳමි" යනුවෙනි. එනම්, යම් මාංසයක් (තමා උදෙසා මරණ ලද බවට) දක්නා ලද්දේ වේ ද, අසනා ලද්දේ වේ ද, සැක කරනා ලද්දේ වේ ද, මේ තුන් කෙළවරින් යුත් මාංසය අනුභව නොකළ යුතු යැයි පවසමි. යම් මාංසයක් තමා උදෙසා මරණ ලද බවට නොදක්නා ලද්දේ වේ ද, නොඅසනා ලද්දේ වේ ද, සැක නොකරන ලද්දේ වේ ද, මේ තුන් කෙළවරින් යුතු මාංශය අනුභව කළ යුතු යැයි පවසමි. මේ තුන්

කෙළවරින් පිරිසිදු වූ මාංසය ත්‍රිකෝටික පාරිශුද්ධ මාංසය ලෙසත් එය සියලුම සංඝයා වහන්සේලාට කැප බව මෙහි දී දේශනා කරලා තියෙනවා.

ඊළඟට **සීහ සේනාපති සූත්‍රයේ** වගේම **විනය පිටකයේ මහා වග්ගපාලියේ භේසජ්ජක්ඛන්දකයේ සඳහන් වන්නේ මෙහෙමයි,** නිඝන්ඨ නාථපුත්‍රගේ ශ්‍රාවකයෙකු වූ සීහ සේනාපති බුදුන් වහන්සේගේ ගුණ අසා බුදුන් වහන්සේ බැහැ දැකීමට ගියේය.

ඔහු බුදුරජාණන් වහන්සේගෙන් ධර්මය අසා සෝවාන් ඵලයට පත්ව නිඝන්ඨනාථ පුත්‍රගෙන් ඉගෙනගෙන තිබූ මිථ්‍යා දෘෂ්ටිය අත්හැරීය. සීහ තෙමේ බුදුන් ප්‍රමුඛ මහා සංඝයා වහන්සේලාට සිය නිවසේ දනට ආරාධනා කළේය. **නිඝණ්ටයෝ විශාලා මහ නුවර හන්දියක් පාසා රැස් වී දෙඅත් අහසට ඔසවාගෙන, "අහෝ... අද සීහ සේනාපතියා විසින් තරබාරු සිව්පාවකු මරා ශ්‍රමණ භවත් ගෞතමයන් හට බතක් පිසින ලදි. ශ්‍රමණ භවත් ගෞතමයෝ තමන් උදෙසා මරණ ලද සතෙකුගේ මස් දැන දැනම අනුභව කරන්නේය...."** යනුවෙන් චෝදනා කළහ. මේ කරුණ මුල් කරගෙන බුදුන් වහන්සේ තමා වෙනුවෙන් මරණ ලද යැයි නොදුටු, නොඇසූ, සැකයක් නොමැති මේ තුන් කෙළවරින් පිරිසිදු ත්‍රිකෝටික පාරිශුද්ධ මාංසය කැප යැයි සංඝයාට අනුදැන වදාළ සේක.

**තව ද සූත්‍ර පිටකයේ අංගුත්තර නිකායේ මනාපදායී සූත්‍රයේ මෙහෙම සඳහන් වෙනවා, දිනක් සෝතාපන්න**

ශ්‍රාවකයෙකු වූ උග්ග ගෘහපතියා භාග්‍යවතුන් වහන්සේ උදෙසා අපූරු දානයක් පිළියෙල කළේය, ඔහු එම දානය පිළිගැන්වූයේ අපූරු කතාවක් ද කියමින්ය.

මනාප දේ දන් දෙන තැනැත්තා මනාප දේම ලබන්නේ ය" උග්ග ගෘහපතියා මෙසේ තමන් කැමැති දේ බුදුන් වහන්සේට ද පූජා කරන ලදි, ඒ අතර දෙබර ගෙඩි මුසු කළ ඌරු මස් පිළිගන්වන ලදී.

ඒ වගේම විනය පිටකයේ පාරාජිකා පාලියේ චීවර පටිග්ගහන සික්ඛාපදයේ මෙහෙම සඳහන් වෙනවා, දිනක් උප්පලවන්නා රහත් මෙහෙණින් වහන්සේ සැවැත්නුවර අන්ධ වනයේ විවේක සුවයෙන් වැඩ වසන කල්හි එක්තරා සොරු කණ්ඩායමක් ගවයෙකු මරා මස් වෙන් කොට යන අතරතුර දී, උත්පලවන්නා තෙරණින් වහන්සේ දැක,

"යම් කිසි කෙනෙක් මෙය දකින්නේ වේද, මෙය ඔහු වෙත පූජා කරන ලද්දේය." යැයි පවසා එතනින් නික්ම ගියෝ ය. එය කන්වැකුණු උත්පලවන්නා තෙරණින් වහන්සේ එය ආරාමයට ගෙනගොස් දුරු මිරිස් දමා සකස්කොට වේළුවනාරාමයට ගොස් එය බුදුරජුන්ට පූජා කළ සේක.

ඒ වගේම විනය පිටකයේ මහා වග්ග පාලියේ භේසජ්ජඛන්දකයේම තියෙනවා, "බුදුන් වහන්සේ ප්‍රමුඛ සංඝයා වහන්සේලා 1250 නමකට අලුත පැහැදුණු එක්තරා ඇමැති කෙනෙක් විසින් මස් තලි 1250 ක් පූජා කරන ලදි..." යනුවෙන්. දැන් ඔබට

ත්රේරෙනවා ද මේවා නොදැන කෑගහන්න ගියාම මොකද වෙන්නේ කියලා. **බුදුහාමුදුරුවෝ කියන්නේ ජෛන සාදුවරයෙක් නෙවෙයි.** මිනිස්සු මේවා දැනගන්න ඕන. එහෙම නැත්තම් ජෛනයෝ ටිකක් තමා අන්තිමට ඉතුරුවන්නේ.

**මට එතකොට තේරුණා මේ බුද්ධාගම ලංකාව තුළ කොච්චර ප්‍රාථමික ද තාම කියලා.** එතකොට ඇත්තටම අපි කරන්න ඕනෑ මේ මිනිස්සුන්ගේ චින්තනය වෙනස් කරලා, සැබෑ බුද්ධ වචනය, සැබෑ දහම, සමාජ ගත කරන්න ඕනෑ.

ඔන්න ඔය විදියට ටිකෙන් ටික අවබෝධය පුළුල් වුණා. ඒ පුළුල් වෙනකොට මම එකවර ප්‍රතිඥා කලේ නැහැ, මම හොඳට පරීක්ෂා කළා මම ගැන, මගේ සිත පත්වෙන අවස්ථා, ඒ අවස්ථා පෙළ දහමත් එක්ක සැසඳෙන විදිය, ඒක හරියටම පරීක්ෂා කරලා මම කිව්වා, මම හිතන්නේ 2012 වසරේ හෝ 2013 වසරේ, **"මේක තමයි මගේ අවසන් භවය, මම නැවත උපදින්නේ නැහැ, මම රහත්, පුනර්භවය සුන් කළා"** කියල ප්‍රතිඥා කළා. ඊට පස්සේ ලොකු කතාන්දරයක් හැදුව නැවතත් පුනර්භවය නැතිකළ රහතුන් කොහෙවත් කවදාවත් කියන්නේ නැහැ, කට වහගෙන ඉන්නවා කියල. කියනවානම් මාන්නය කියල මෝඩ කතාවකුත් හදල කිව්වා. ඒ සියලු තර්ක බුද්ධ වචනය ඇසුරින් බොරුබව පෙන්නුවා.

**පිළින්දිවච්ච සූත්‍රයේ තියෙනව උන්වහන්සේ උන්වහන්සේගේ රහත්බව කිව්වා. මම රහත් පුනර්භවය නැති කළා කියල කිව්වා.** ථේර ථේරී ගාථා පාලියේ රහත්වරු, රහත් මෙහෙණිවරු සියල්ලෝම පැහැදිලි කළා අපි රහත් වුණා. මේ අපේ අවසාන උපත අපි ඒ මාර්ගය සොයාගත්තා, ප්‍රත්‍යක්ෂ කළා. අපි කළයුතු යමක් තියෙයිනම් ඒ සියල්ල කළා කියල ඒ උත්තමයෝ පැහැදිලි කළා. ගෞතම බුදුන්වහන්සේ බුදුවෙච්ච ගමන්ම තමන් බුදුවරයෙක්, රහත්වරයෙක් කියල ප්‍රතිඥා කළා.

ඒ වගේම **මජ්ඣිම නිකායේ අරිය පරියේසන සූත්‍රයේ** සදහන් කරලා තියෙනවා උපක ආජීවකට, **"මේ ලෝකේ ඉන්න එකම රහතා මම වෙමි... සම්මා සම්බුද්ධ වෙමි..." කියලා.** ඒ වගේම තමන් වහන්සේට ගුරුවරයෙක් නැතිබව, තනියෙන් සත්‍ය අවබෝධ කළ බව, එකම රහතා බව, තමන් සම්මා සම්බුද්ධ කියලා, තමන් බරණැසට වඩිනා බව. මේ සියල්ල පැහැදිලි කළාම උපක කිව්වා, **" එහෙම නම් ඔබ අනන්ත ජිණ..." කියලා, උපක යන්න ගියා.** ඔය විදිහට මගේ අවබෝධය පිළිබඳව සඳහන් කිරීමත් සමග නැවතත් ඒ මෝඩ තර්ක අකුලාගෙන හැංගුනා.

**මම මේ ලෝකේ සත්‍ය හරියටම අවබෝධ කළා. දැන් ඉන්පස්සේ අහනවා අවබෝධ කළානම් ඒ කියන්නේ ඒක මාන්නයද කියල.** ඉතිං අවබෝධ කළාම ඒක නොකළා කියන්න ද?. මම දැන් ඔබෙන් ප්‍රශ්නයක්

අහනවා. ඔබ සේවය කරන සේවා ස්ථානයේ ප්‍රධානියා ඉංජිනේරුවරයෙක්. ඔහුට තියෙනව ඒ පිළිබඳව පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක්. කවුරුහරි කෙනෙක් ඔහු ළඟට ඇවිත් අහනවා ඔබ ඉන්ජිනේරුවෙක්ද නැත්නම් මෙහි සේවකයෙක්ද කියලා.

ඔහු කුමක් කියයිද? ඉංජිනේරුවෙක් කියල කියනවා. ඒ කිව්වාම ඔහු කියනවා මම ඉංජිනේරුවෙක් කියල. ඒ කිව්වම අහන මිනිසාට ඒ ගැන තේරෙන්නේ නැත්නම් ඔහු පිළිගන්නේ නැහැනේ. අන්න ඒ වගේ තමයි මගේ රහත් බවත්. ඒක පිළිගන්නේ මා හා සම වූ ඥානයක් ඇත්තාවූ ද, ශ්‍රද්ධාවක් ඇති, ඒ ධර්මය පිළිගන්න අයට පමණයි.

මම උදාහරණයක් කියන්නම්. ගෞතම බුදුන් වහන්සේත්, දෙවදත්තත් එකම ආරාමයේ ජීවත්වුණා. සැරියුත් තෙරත්, මුගලන් තෙරත් ඒ ආරාමයේම සිටියා. නමුත් ගෞතම බුදුන් වහන්සේ බුදුවරයෙක්. උන් වහන්සේගේ අවබෝධය දේවදත්ත පිළිගත්තේ නැහැ. ඒ අවබෝධය පිළිගත්තේ සැරියුත්, මුගලන් ආදී ඒ දහම තේරුම් ගත්ත, ඒ දහම් මග වඩපු, ඒ දහම් මගෙන් දුක නිවාගත්ත, කාමාශාවන් නැති කරගත්ත ඒ ආර්යන් වහන්සේලා විතරයි.

මනුස්සයෙක් බුදුකෙනෙක් වෙන්නේ උන්වහන්සේ කියන දේ තේරුම් ගන්න අයට පමණයි. මේ භෞතික ලෝකේ ඕනෑම දෙයක් තමන්ගේ ගුරුවරයා වෙන්න පුළුවන්. මතක තියාගන්න. ගුරුවරයා ඕනෑම වෙලාවක

**සූදානම් වෙලා ඉන්නේ ඔබව ගලවා ගැනීම සඳහා. ඔබ සූදානම් නැති නිසා ගුරුවරයා ඔබ ඉදිරියේ පෙනී නොසිටිනවා. ඔබ සූදානම් වුණ විගසම ගුරුවරයා ඔබ ඉදිරියෙහි පෙනී සිටිනවා.**

ඒක තමයි අපි දන්නා දහම. කෙනෙක් රහත් වුණා නම් උන්වහන්සේ මාන්නය නැති කළ කෙනෙක්. ඒ අනතිමානි තත්වයට සිත පත්කළ උතුමෙක් කිව්වත් එකයි නැතත් එකයි. ඒ කියන්නේ ලොකුකමක් හදාගන්න නෙවෙයි සමාජයට යහපතක් කරන්න. ඔබ කල්පනා කරලා බලන්න පිටිදූවේ සිරිධම්ම හාමුදුරුවන්ට විශාල ප්‍රසිද්ධියක් තිබුණා. රටේ ඉන්න දායක කාරකාදීන් සියල්ලෝම උන්වහන්සේට අනුග්‍රහය දැක්වූවා.

දැන් උන්වහන්සේ ධර්මාවබෝධ කළා කිව්වාම ඕනෑම කෙනෙක් හොඳයි කියනවද, බණිනව ද? බණිනවා.. දැන් මට තිබුණනේ අර සම්පත් සියල්ල තියාගෙන, වරප්‍රසාද සියල්ල භුක්ති විඳගෙන කට වහගෙන ඉන්න. එහෙම ඉන්නේ නැහැ සත්‍ය අවබෝධ කළ කෙනෙක් එළියට ඇවිත් කථා කරනවා තමන් සතු සියල්ල අහිමි වුණත්. ඒක තමයි උන්වහන්සේගේ අව්‍යාජ බාවය.

ඒ නිසා එළියට ඇවිත් කියනවා අපි අවබෝධ කළා, ඒ මාර්ගය සොයාගත්තා, මෙන්න මේ විදියටයි එතනට යන්නේ කියලා. **ඒක ප්‍රසිද්ධිය ගන්නවත්, ධනය ගන්නවත් කියන දෙයක් නෙවෙයි. තිබුණ දේවල් නැතිකරගන්න කියන කතාවක්.**

යම් ධනයක් තිබුණා නම් ඒ සියල්ල නැති කරගැනීමටත්, යම් ප්‍රසිද්ධියක් තිබුණානම් ඒ සියල්ල නැති කරගැනීමටත් කියන කතාවක්. එතකොට අපි දැනගෙන හිටිය සියල්ලෝම හිංසා කරන බව. ඒත් මා ප්‍රකාශ කළා. ඒ ප්‍රකාශ කළා විතරක් නෙවෙයි දැනගෙන හිටිය. මේ සියල්ලෝම අපිට විරුද්ධව බලමුළු රැස් කරන බවත් විශේෂයෙන්ම භික්ෂූන් වහන්සේලා. ඒත් බයක් ඇතිවුණේ නැහැ. ඒ වනවිටත් අවශ්‍ය සියලු ධර්මය පරිපූර්ණ වශයෙන් තේරුම්ගත්ත නිසා.

**හැමදාම බණිනවනෙ කකුසඳ බුදුන්ටත් බැන්නා, කෝනාගමන බුදුන්ටත් බැන්නා. කාශ්‍යප බුදුන්ටත් බැන්නා. ගෞතම බුදුන්ටත් බැන්නා. ඉතිං ඉතිරි අයටත් එසේමයි.** ඒ බණින අයට බණින්න දෙන්න ඕනෑ. හොඳ කියන අයට හොඳ කියන්න දෙන්න ඕනෑ සමාජය දෙකට බෙදුණා. දාර්ශනික වශයෙන් දෙකට බෙදුණා. **දාර්ශනික වශයෙන් දෙකට බෙදුණේ නැති නිසා තමයි අපේ රටේ මෝඩයෝ රජ කළේ. දැන් එහෙම කරන්න බැහැ මිනිස්සු තර්ක කරනවා, ප්‍රශ්න කරනවා, ධර්මය ගැන සොයනවා.** මේ ලෝකේ නැවත වතාවක් ඒ දහම සොයන්න පටන්ගත්තා. නව පිබිදීමක් ආරම්භ වුණා, නව යුගයක් ආරම්භ වුණා. මම සියලු කෙලෙස් නැති කළා, සිත ආලෝකවත් කරගත්තා, ලොව්තුරු සුවයට පත්වුණා, නව ජීවනයට පත්වුණා. ඒක මේ කට කහනවට කියපු කතාවක් නෙවෙයි. අනික බොරුවට රහත් කියල කියන්න බැහැ. ඒක එළිවෙනවා. ඒ වගේම නම වෙනස් කළා.

"සමන්තභද්‍ර" කියලා පාවිච්චි කළා. එතකොට කිව්වා උඹ ජීවත්වෙන්නේ තව මාස තුනයි කියල. දැන් අවුරුදු හතරක් වෙනවා. වස් වදිනවා කිව්වා ඒ ඔක්කොම කතාන්දර බවට පත්වුණා. කෙනෙක් හරියටම අවබෝධ කළොත් ඒ කෙනාගේ ඒ අවබෝධය වෙනස් කරන්න කාටවත් බැහැ. හේතු කාරණා සහිතව ඒ සියල්ල බොරුවක් කියන්න කිසිවෙක් එන්නේ නැහැ. දැන් මම මේ දේශනා කරන දහම බොරුයි කියන්න සමත් වෙච්ච කිසිම ශ්‍රමණයෙක් නැහැ, පැවිද්දෙක් නැහැ, කිසිම පූජකයෙක් නැහැ, කිසිම උගතෙක් නැහැ, කිසිම ධනවතෙක් නැහැ. එයයි මගේ අවබෝධයේ විශාරදබව.

මේ සිව් පිරිස අතර කිසිම කෙනෙක් නැහැ මගේ අවබෝධය, පරිපූර්ණත්වය, රහත්බව නොවේය කියා සකාරණව, සහේතුකව කරුණු කාරණා නිවන්මග ඇසුරෙන් ඉදිරිපත් කළහැකි කිසිවෙක් නැත. නිකම් බැණල දුවන්න පුළුවන්. දැන් බලන්න ගෞතම බුදුන්වහන්සේට කොච්චර අපහාස කළා ද? පාරේ යනකොට දොරවල් පවා වැහුවා, ළිංවලට පිදුරු දැම්මා, මිනිස්සු ගැහුවා, ගල් පෙරළුවා, මරන්න ලෑස්ති කළා. තියෙන සියලු දසවධ දුන්නා. ඒත් උන්වහන්සේගේ බුද්ධත්වය නැති වුණේ නැහැ.

ඒ වගේ තමයි මගේ අවබෝධයත් එය නැතිකරන්න කාටවත් බැහැ. එකම එකක් කරන්න පුළුවන්. ඔබට අවශ්‍යනම් ඒ අවබෝධය පරීක්ෂා කරලා ඒ දුක නැතුව

ඉන්න විදිය අෂ්ටලෝක ධර්මයෙහි කම්පා නොවී ඉන්න විදිය, මුළු සමාජයක් බණිද්දී, චෝදනා කරද්දී, ඒවා ඉදිරියේ නිහඬව ගමන් කරන විදිය බලාගෙන ඉඳලා ඔබටත් එසේ වන්නට පුළුවන්.

ඒ සඳහා කළ යුතු එකම එක දෙය මේ දහම් මග අහල ටිකෙන් ටික සිත වඩන්න, පුරුදු කරන්න, සිත පටිසෝතගාමී දිශාවට යොමු කරන්න එවිට ඔබට දහම තේරේවි. නැත්නම් දහම කියල හැමෝම හිතාගෙන ඉන්නේ පොත්ටික. පොත්වල තියෙන්නේ හරි ලස්සන කථා නේ. ඒ කථා කියවල, අහල ඒවාට අගුලුපත් තියමින් ජීවත් වෙනවා. සිත හදාගන්නේ නැහැ කවුරුවත්. අපි කියන්නේ මිනිසුන්ට සිත හදාගන්න කියල. මිථ්‍යා විශ්වාස, පුදපූජා ඒවා කරන්නේ නැතුව සිත පුරුදුකරන්න කියල විපස්සනාවට. ඒක හරිම ලේසියි. ගෙදර දී කරන්නත් පුළුවන්, පැවිදිවෙලා කරන්නත් පුළුවන්. අන්න ඒ මගට ටිකෙන් ටික ආවොත් ජීවිතය ආලෝකවත් වෙනවා, වාසනාවන්ත වෙනවා. මම ලෞකික ජීවිතේ ඉඳල ඒ ජීවිතය ගත කරලා ගිහියෙක් ලෙසත්, පැවිද්දෙක් ලෙසත් මම එයින් එතෙර වුණා. නිවුණා, සැනසුණා, සිසිල්වුණා. **මම ඔබට මතක් කරන්නේ මම වගේ වෙන්න කියල. එක ලේසියෙන් කරන්න බැහැ, ඒ මග අසන්න. ඒ මග වඩන්න. මිනිසුන්ට බණින්න දෙන්න. ගහන්න දෙන්න, අපහාස කරන්න දෙන්න. කරපු වරදකට නෙවෙයි නොකළ වරදකට.**

මම පෙන්වන මාර්ගය, මම උගන්වන ඉගැන්වීම පුද්ගලයෙකුගේ මනස අවදිවීම පිණිස, ආලෝකය උදාවීම පිණිස, ශාන්තිය ඇතිවීම පිණිස, සිත නිවීම පිණිස, සොබා දහම අඳුනා ගැනීම පිණිස, විශ්වය තුළ පවතින්නා වූ, මමත්වය නිසා සැඟව පවතින්නා වූ, රිද්මය තේරුම් අරගෙන ප්‍රත්‍යක්ෂ ඤාණයෙන් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස හේතුවෙනවා. ඒක තමයි අවබෝධය කියන්නේ.

යම් කෙනෙක් මේ සොබා දහමේ රිද්මය අඳුනා ගත්තොත්, ඒ මනුස්සයා අවබෝධයට පත්වෙලා. ඒ විතරක් නෙවෙයි ඒ මනුස්සයාගේ අවබෝධය පූර්ණයි. **මනස අවදිකරගැනීමයි බුදු දහම.** මිනිස්සු පශ්චාත්තාප වෙන්නේ, හඬාවැලපෙන්නේ, විඳවන්නේ, කඳුළු සලන්නේ, වේදනා විඳින්නේ මනස අවදිකරගන්න බැරිවෙච්ච නිසා. මම උගන්වනවා මනස අවදිකර ගැනීම පිණිස, සිත අවදිකරගැනීම පිණිස මාර්ගයක්. සිත අවදිකරගත් කෙනෙක්ගේ මුහුණ ප්‍රබෝධමත්, ක්‍රියාකාරකම් ප්‍රබෝධවත්, සිතුවිලි ප්‍රබෝධවත්, වචන හා ක්‍රියාකාරකම් පිරිසිදුයි. ඒක තමයි බුද්ධ වචනය. ඒක තමයි මා උගන්වන දහම, ප්‍රතිපදාව.

ප්‍රශ්නය :- අවබෝධ වුණා කියල නමත් වෙනස් කරගන්න ඕනෙද?

පිළිතුර :- **නමක් වෙනස් කරන්න ඕනෑ නැහැ. දර්ශනය වෙනස් වුණාම නම වෙනස් වෙනවා.** දැන් ඒකට හොඳම දේ තමයි සමහරු කියනවනේ දැන් එයා

සිරිධම්ම හාමුදුරුවෝ වගේ නෙවෙයි බණ කියන්නේ වෙනස් විදියකට මිනිසුන්ට බණිනවා. මිනිසුන්ට දොස් කියනවා ඒ කියන දේවල් අපිට තේරෙන්නෙත් නැහැ. එතකොට මේ නම වෙනස් කරපු එක සාධාරණයිනේ. කෙනෙක් අවබෝධ කළා කියන්නේ ඔහුගේ පෞරුෂය වෙනස් වෙනවා. පෞරුෂය තියෙන කෙනෙක් සමාජය ඉස්සරහා හදාගත්ත එකකින් ජීවත්වෙනවා. ඔහුට ගෞරවය අවශ්‍ය නිසා ඔහු මිනිසුන්ට ගෞරව කරනවා. ඔහුට සැලකිලි අවශ්‍ය නිසා සලකනවා. හැබැයි සත්‍ය අවබෝධ කළ මුනිවරයෙක්, ඒ උතුම් සත්‍ය අවබෝධ කළ කෙනෙක් ඒ සියල්ලෙන් නිදහස් වෙනව. ඒ නිසා නිදහසේ කතා කරනවා.

**මම කියන්නේ ඒකට ආර්ය භාවයට පත්වෙච්ච උතුමෙක් ශබ්දකෝෂය ශූන්‍ය කරලා බහ තෝරනවා කියල. ළමයි තමයි හරියටම භාෂාව පාවිච්චි කරන්නේ.** මොකද ඒ කවුරුවත් භාෂාවේ නීති දන්නේ නැහැ. ඒ නීති දැනගත්ත දවසේ ඉඳල ඒ ළමයි බහ තෝරන්නේ නැහැ තමන්ගේ වැඩිහිටියන්ට සාපේක්ෂව වචන පාවිච්චි කරනවා විතරයි. මම කියන ඒවා තේරෙනවද. මම ආයෙමත් බහතෝරන්න පටන් ගත්තා. මම නිදහසේ කතා කරනවා. සමාජයේ දකින වැරැදි මම විවේචනය කරනවා. මේ හැමෝම මට බැන්නත් එකයි, මැරුවත් එකයි. මට විශේෂයක් තේරෙන්නේ නැහැ.

ප්‍රශ්නය :- **ඔබ වහන්සේ ප්‍රහාරාත්මක වචනනේ කියන්නේ? එකට හේතුව ?**

පිළිතුර :- **සත්‍ය අවබෝධ කළ ඕනෑම කෙනෙක් සමාජයට ප්‍රහාරාත්මක වචන එල්ල කරනවා.**

ප්‍රශ්නය :- එතකොට මිනිසුන්ගේ සිත් කැඩෙනවා?

පිළිතුර :- **මිනිස්සුන්ගේ සිත් කඩන්නේ නැතුව අවබෝධ කරන්න** බැහැ. **සිත් රිදවන්න ඕනෑ ඒ මාර්ගය දන්නා අය ඒක දන්නවා.** අපි දන්නා මාර්ගයේ තියෙන්නේ සිත් හැදීමක් නොවේ. දැන් ශ්‍රාවකයෙක් ඇවිත් අපෙන් අහනවා අපිට අවශ්‍යයි ඔබ වහන්සේ දේශනා කරන නිවන තේරුම්ගන්න. එතකොට අපි එයාට ගෞරව කරලා අතින් අල්ලාගෙන එක්ක යන්නේ නැහැ. අපි එයාට කියනවා, "**ගිහිල්ල සෝදනවා වසිකිළිටික**" කියල. නමුත් එයා අවේ මාර්ගය අහන්න.

ප්‍රශ්නය :- **නමුත් ස්වාමීනි, කෙනෙක් අහන්න පුළුවන් අපි සමාජයේ අහල තියෙන්නේ භාග්‍යවත් වූ බුදු පියාණන් වහන්සේ මිනිසුන්ගේ සිත් පිරිසිදු කළා, සිත් හැදුව කියල. නමුත් ඔබ වහන්සේ කියන්නේ මිනිසුන්ගේ සිත් කඩනවා කියල.**

පිළිතුර :- මම ප්‍රශ්නයක් අහන්නම්. තුවාලයක් තියෙනවා උඩින් කබොල්ලක් හැදිච්ච. ඔබට කියනවා බෙහෙත් දාන්න කියල. ඔබ කොහොමද බෙහෙත් දාන්නේ? තුවාලේ පිරිසිදු කරලනේ. එතකොට අයිති කෙනාට රිදෙනවානේ. එතකොට රිදුණාම කෑගහනවා නේද?. එතකොට ඔහු කෑගහවී කියල බයට කබොල්ලට උඩින් බෙහෙත් දාන්නේ නැහැ. මම

හොඳ දොස්තර කෙනෙක්. මම දන්නවා තුවාලවලට බෙහෙත් දාන්න. මම ළඟට දරුණු උඩු දුවපු තුවාලයක් තියෙන කෙනෙක් ආවොත්, මම කරන්නේ කැගහද්දී කබොල්ල ගලවනවා. ඊට පස්සේ පුලුන් දාලා හොඳට සුද්ධ කරනවා. හොඳට සුද්ධ කරලා පණුවෝ අරන් දාල, ඩෙටෝල් දාල සෝදලා දානකොට අර රෝගියා මට බණින්නේ නැද්ද. බණිනවා. එතකොට මම ප්‍රශ්නයක්කර ගන්නේ නැහැ. මොකද මෙයා මට තුවාලේ සෝදන නිසා තමයි මේ බණින්නේ. දැන් මේ තුවාලේ සුවපත් වුණාම මෙයා මේකේ අනික් පැත්ත කරනවා. මොකද මම දෙපැත්ත දන්නා කෙනෙක්. දෙපැත්ත අවබෝධ කළ කෙනෙක්. ඒ දෙපැත්තම අවබෝධ කළ අයට මොන දේ කළත්, කිව්වත් කිසි ගානක් නැහැ.

තුවාලේ සුද්ධ කරනවානම් හරියට කබොලු කඩලා පිරිසිදු කරන්න ඕනෑ. ඒ වගේ ඒ සත්‍ය අවබෝධ කරන මුණිවරු ඒ අවබෝධය සොයා එන ශ්‍රාවකයාගේ සිත් සුවපත් කරන්නේ නැහැ. සිත් කුඩු කරනවා. සිත් සොරකම් කරනවා. ඉන් පස්සේ තමයි සුවපත් කරන්නේ. අද බුද්ධාගමේ ගැඹුරු දර්ශනයක් නැහැනේ. සාම්ප්‍රදායික චාරිත්‍ර වාරිත්‍ර ටිකක්නේ බුද්ධාගම කියල හිතාගෙන ඉන්නේ. ඒක නිසා තමයි මේ ප්‍රශ්න තියෙන්නේ. අපි දන්නා ඒ ගැඹුරු දර්ශනයේ තියෙන්නේ නම් සිත් කඩලා සුවපත් කරන්නේ. දැන් මම ප්‍රශ්නයක් අහන්නද? ඛේමා බිසව ගෞතම බුදුහාමුදුරුවෝ ළඟට එනකොට උන්වහන්සේ ළඟ

හිටියේ කවුද? ලස්සන ස්ත්‍රියක් පවන් සලමින් සිටියා. මම කියන දේ පැහැදිලිද?. උන්වහන්සේ ඒ බිසවට පේන්න සලස්සල තියෙන්නේ අපි අහල තියෙන විධියට මොකක්ද. ඒ ස්ත්‍රිය කඩාගෙන ඇදගෙන වැටිලා මිය යන අවස්ථාවක්. මුලින්ම වුණේ ඒකෙන් ඇයගේ සිත කඩා වැටුණා. ඊට පස්සේ සුවපත් වුණා. අන්න ඒක තමයි මම කරන්නෙත්.

ප්‍රශ්නය :- ඔබ වහන්සේ කියන්නේ මිනිස්සුන්ට අපහාස කරලා, බැණලා, තර්ජනය කරලා මඟ පෙන්වන්න ඕන කියල ද?.

පිළිතුර :- සච්චවිභංග සූත්‍රයේ මෙසේ සඳහන් වෙනවා. **සැරියුත් මහා තෙරුන් වහන්සේ වදන මවයි, මුගලන් මහා තෙරුන් වහන්සේ කිරිදෙන මවයි.** සැරියුත් මහා තෙරුන් වහන්සේ සෝවාන් වීමට මාර්ගය කියනවා. මුගලන් මහා තෙරුන් වහන්සේ රහත් වීමට මාර්ගය කියනවා. ඔබට මා කියන දේ තේරෙනවද?.

දැන් ඔය කියන විදිහට කෙනෙක් රහත් බවට පත්කරන්නේ සුකුමාල ළද බොළඳ කෙනෙක් ද? එහෙම නැත්නම් සිත හයිය කෙනෙක් ද ? ඒක කරන්න ඕනෑ සිත හයිය කෙනෙක්. ඒ දුර්වල හිත් අතට අරන් කඩලා කුඩුකරලා පිරිසිදුකරලා ඒ නිර්වාණයට, ඒ ලොව්තුරු සුවයට, ඒ පරමානන්දයට, ඒ සදාතනික ශාන්තියට එක්ක යනවා. ඒක නිසා තමයි උන්වහන්සේට කියන්නේ කිරිදෙන අම්මා කියල. **මමත් කිරිදෙන**

මවක්. මම කියන දේ තේරෙනවද?. ඒ කිරිදෙන අම්මා කවදාවත් ළඳ බොළඳ විදියට කථා කරන්නේ නැහැ. එහෙම බැරිකමක් නෙවෙයි. සිත සුවපත් වෙන්නේ නැහැ එතකොට. සාපේක්ෂ ලෝකේ හිත මිතුරුකම් හදාගෙන යාළුමාළුකම් හදාගෙන නැවතත් අර පරණ පච්කාර ලෞකික ජීවිතේට යනවා. අපි ඒ සියලු බන්ධන කඩනවා. බන්ධන කඩලා එයාලාට ආර්ය මාර්ගය පෙන්නනවා. තුවාලවල කබොලු කඩනවා. කඩලා සුවපත් කරනවා. හරියටම බෙහෙත් දානවා. ඒ නිසා තමයි කියන්නේ භව දුකට වෙදාණන් කියල. මම කියන දේ පැහැදිලිද?

ප්‍රශ්නය :- ඔබ වහන්සේ කියන්නේ සියලු බුදුවරු, මුණිවරු දරුණු, කටුක ලෙස තම ශ්‍රාවකයන් නිර්වාණයට රැගෙන ගියා කියල ද?

පිළිතුර :- කාටවත් කවුරුවත් නිර්වාණයට රැගෙන යන්න බැහැ, බුදුවරු, මුණිවරු, රහත්වරු කරන්නේ මග කියන එක පමණයි. යන නොයන එක ඒ අයගේ කාර්යයක්. හැබැයි ඒ බුදුවරු, ඒ මුණිවරු අධර්මයට, අයුක්තියට එරෙහිව කථා කරනවා. එච්චරයි ඒ සත්‍ය අවබෝධකළ සියලු මුණිවරු එසේයි. දැන් ගෞතම බුදුහාමුදුරුවෝ, කකුසඳ, කෝනගම, කාශ්‍යප ඒ සියලු බුදුවරු එලෙසමයි. මුගලන් මහා තෙරුන් වහන්සේ අපි අහල තියෙනවා, මච්චරිය කෝසිය සිටාණෝ කැවුම් හැදුව සිටුදේවිය සමග උඩුමහලට වෙලා. කැවුම් හදල යහතින් කැවුම් කන්න දුන්නද

**නැත්නම් මාලිගාව දුමින් වහල නොයෙකුත් දේශනා පවත්වල කැවුමුත් අරගෙන සිටුවරයයි, දේවියයි එක්ක ජේතවනාරාමයට එක්ක ආවා ද? ජේතවනාරාමයට** එක්ක ආවා. අන්න ඒක තමයි රහත්බව. මම කියන එක පැහැදිලි ද? ඔබට. කෙනෙක් වැරැදි මග යනවානම් එයාට මුලින් කරුණු කියල පහදනවා.

**අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ කේසි සූත්‍රය,** ගෞතම බුදුන්වහන්සේ හමුවෙන්න කේසි කියල මිනිසෙක් එනවා. ඔහු අසුන් බලාගන්න කෙනෙක්. ඔහුට කියන්නේ අස්ස ධම්ම සාරථී. ඔහු ඇවිල්ලා අහනවා මෙහෙම. මම අසුන් බලාගන්න කෙනෙක්. මම කේසි. ඔබ වහන්සේ පුරුෂයන් දමනය කරන කෙනෙක්නෙ. මම නම් අසුන් බලාගන්නේ මෙහෙමයි. සමහර අසුන් හරි කීකරුයි වචනෙන් දෙකෙන් කියනවා. හොඳයි දමනය වුණා ඉවරයි. සමහර අසුන් ටිකක් කීකරු කරන්න වචනයක් දෙකක් කියන්න ඕනෑ. සමහර අසුන් එහෙම බැහැ ස්වාමීනි කෝටුවකින් ගහල තමයි දමනය කරන්න ඕනෑ, සමහර අසුන් කොහොමවත් දමනය කරන්න බැහැ. මම ඒ වගේ අසුන් මරල දානවා. එහෙම කියල කේසි අහනවා දැන් ඔබ වහන්සේ පුරිස ධම්ම සාරථීනේ ඔබ කොහොම ද? මේ මිනිස්සු දමනය කරන්නේ... "මමත් ඔය විදියටමයි කේසි...." ඒ කියන්නේ ඔබ වහන්සේ මිනිසුන් මරනව ද? ඔව් කේසි, ඒ කියන්නේ ඔබ වහන්සේ ප්‍රාණඝාතය අනුමත කරනව ද? නැහැ කේසි, සමහර අයට කුසලය මොකක්ද කියල කිව්වාම,

මාර්ගය කිව්වාම, සිත ශූන්‍ය කරන ප්‍රතිපදාව කිව්වාම ඒ ගොල්ලෝ ඒක එකවර තේරුම් අරගෙන සසර දුක නිවාගන්නවා.

සමහර අයට ඒ සිත ශූන්‍ය කරන කුසලය තේරෙන්නේ නැහැ. ටිකක් වෙලා කරුණු කාරණා පැහැදිලි කළාම ඒ මාර්ගය තේරුම් ගන්නවා. තවත් සමහර අයට නොයෙකුත් ප්‍රායෝගික ක්‍රියාකාරකම් කරවලා කලක් තිස්සේ පුරුදු කරවලා සිත සුද්ධ කළාම ඔවුන් තේරුම් ගන්නවා. සමහර අයට කේසි මොනතරම් වෑයම් කළත් තේරුම් ගන්න බැහැ. මම එතකොට ඔවුන්ව මරාදානවා හෙවත් උපදෙස් දීමෙන් වළකිනවා. මම කියන දේ පැහැදිලිද. මමත් ඒ ජාතියේ කෙනෙක්. මමත් උපදෙස් දීමෙන් අයින්වෙනවා.

එතකොට ගෞතම බුදුන්වහන්සේ ක්‍රම තුනකින් ශ්‍රාවකයෝ මෙල්ල කරනවානේ. තුන්දෙනෙක් මෙල්ල වෙනවා එක්කෙනෙක් මෙල්ල වෙන්නේ නැහැ. එයාව අයින් කරනවා. දැන් පැහැදිලිද, හොඳින් මෙල්ල කරනවා, නරකින් මෙල්ල කරනවා, හොඳින් නරකින් මෙල්ල කරනවා බැරිම වුණොත් අයින් කරනවා. කුසලය පෙන්නලා මෙල්ල කරනවා, අකුසලය පෙන්නලා මෙල්ල කරනවා, කුසලය අකුසලය පෙන්නලා මෙල්ල කරනවා බැරිම වුණොත් ඉවත් කරනවා. දැන් ඔබට පැහැදිලි ද?, **ඒ රහත් බවට මාර්ගය මේ නූතන ලෝකයට පැහැදිලිව දේශනා කළේ මමයි. ඒ මාර්ගය තවම සමාජයට නුහුරුයි. සත්‍ය අවබෝධ**

කළ විශ්වයේ පරම සත්‍ය සාක්ෂාත් කළ උතුමෙක් දැක්කේ නැහැ මිනිස්සු. මිනිස්සු හිතාගෙන හිටියේ ජෛන ආගමේ වගේ ඒගොල්ලෝ බාහිර සිල්වතුන් කියල. බුද්ධාගමේ තියෙන්නේ

"නහි සීලවතං හෝති - උප්පජ්ජන්ති තථාගථා
අට්ඨක්ඛරා තිනිපදා - සම්බුද්ධෙන පකාසිතා."

ලෝකයට තථාගතයන් වහන්සේ වඩින්නේ මිනිස්සු සිල්වත් කරන්න නෙවෙයි. ඒ සම්බුදුවරයන් වහන්සේලා අකුරු අටකින් යුතු පද තුනක් මනුස්ස ලෝකෙට උගන්වනවා. ඒ කියන්නේ ත්‍රිලක්ෂණ ධර්මය ප්‍රත්‍යක්ෂ කරනවා එච්චරයි.

ප්‍රශ්නය :- ගෞරවනීය ස්වාමීන් වහන්ස, දැන් ඔබ දේශනා කරනවා දැන් රහතුන්ගෙන් මේ සාසනය පුරවන්න පුළුවන් කියලා. නමුත් දැන් මේ මොහොතේදීත් ඔබ වහන්සේ ප්‍රචණ්ඩව, ශක්තිමත්ව ධර්මය දේශනා කරනවා කියල බොහෝ දෙනෙක් චෝදනා කරනවා. දසදෙනෙක් හිටියොත් මේ ලංකාවේ ඉන්නත් බැහැනේ කියල සමහර අය චෝදනා කරන්න පුළුවන් නේද?.

පිළිතුර :- ඔව්, චෝදනා ඕනෑ තරම් කරන්න පුළුවන්. නමුත් දැන් කවුරුහරි අහල තියෙනවද මම මේ සිවුරු කඩාගෙන මොනවාට හරි දැගලුවා කියල කොහෙවත්. නැහැ, අන්න එච්චරයි. භික්ෂුව මූලික ප්‍රාතිමෝක්ෂ සීලය ආරක්ෂා කරනවා, තමන්ගෙන් නිවන්මග අහන්න එන අයට නිවන්මග

පැහැදිලි කරනවා. මාර්ගය වැරද්දුවාම කෝටු පාර ගහනවා. මගේ ළඟ කොච්චර සිසුන් පැවිදි වෙලා හිටියත් ඒ ගොල්ලෝ වැරද්දක් කළොත් මම කෝටු පාරගහනවා. ඒක තමයි ගුරුවරයෙක් කියල කියන්නේ.

දක්ෂ බැටළුවෝ බලාගන්නෙක් එහෙම නැත්නම් අපි එයාට කියනවා ගොපල්ලෙක් ළඟ කෙවිටක් තියෙනවා. මම ළඟත් ඒ කෙවිට මැරෙන තුරුම තියෙනවා. ඒ ගහන්නේ එයාට තියෙන තරහට නෙවෙයි. එයාව මාර්ගයට ගන්න. දැන් අපි ලොකු බැටළු රැළක් දක්කාගෙන යනවා. ඒ ගොපල්ලා හරි කාරුණිකයි බැටළුවන් කෙරෙහි. එතකොට ඒ එක බැටළුවෙක්හරි කොටියා ඉන්න පැත්තට ගියොත් කෝටුවකින් ගහනවා. ඒ වගේම මගේ දේශනාව අහන අයත් මම ඒ මරුවා ඉන්න පැත්තට යන සිසුවාට කෝටු පාර ගහනවා. ඒ කියන්නේ බණිනවා. ඒ බැන්නහම ඒ ගොල්ලෝ නැවත නිවැරැදි පාරට යොමුවෙනවා. ඒක තමයි බුද්ධ වචනය. ඔවුන් ඇවිත් තියෙන්නේ කාලා බීල සැපට නිදාගෙන ඉඳල යන්න නෙවෙයි. සසර දුක නිවාගන්න. ඒ සසර දුක නිවාග න්න කොට සසර පුරුදු කඩන්න ඕනෑ. කෙලෙස් විනාශ කරන්න ඕනෑ, කෙලෙස් නැතිකරවන්න ඕනෑ. ඒ කෙලෙස් නැතිකරවන මාර්ගය සුන්දර නැහැ.

දේශනාවේ අංගුත්තර නිකායේ, චතුක්ක නිපාතයේ මෙසේ සඳහන් වෙනවා. කඳුළු සලාගෙන, දත්මිටි කාගෙන යායුතු මගකි එය. ඔබට මම කියපු දේ

තේරෙනව ද?. කවුරු හෝ මම ළඟ ඇවිත් සසුන්ගත වෙනවානම්, නැත්නම් කෙනෙක් මගෙන් මේ දේශනාව අසනවානම් ඒ අය එන්නේ කඳුළු සලාගෙන, දත්මිටි කාගෙන යන්න හයිය තියෙනවා නම් පමණයි. වෙන කවුරුවත් එන්න එපා. මොකද ඒ මාර්ගයේ යන්න බැහැ. බුද්ධ ආඥාවේ අංගුත්තර නිකායේ තියෙන විදිය තමයි ඒ. සිත හයිය වෙන්න ඕනෑ. ගොඩාක් හයිය තියෙන්න ඕනෑ, ආත්ම ශක්තිය තියෙන්න ඕනෑ, කැපකිරීම තියෙන්න ඕනෑ. කෙටියෙන් කිව්වොත් සප්ත බෝධි අංග වඩන්න ආත්ම ශක්තිය තියෙන්න ඕනෑ, ඒ බෝධි අංග ධර්ම වඩන්න බැරි කෙනෙකුට ඒ මාර්ගයේ යන්න බැහැ.